## 401 සුර ලොව රාජිණියේ

සුරලොව රාජිණියේ මේදිනේ
තුති දෙමු ඔබ හට පෙම් හදිනේ
ඔබ මහිමා ගයමුව නිතිනේ
ඔබ සරණ යදිමුව බැතිනේ

මංගල වේ ජය මංගල වේ
ජය මංගල වේ ඔබ හට මේදිනේ
අප පෙම්බර මවුනී රන් බර රැජිණී
වේ තුති වේ ඔබහට නිතිනී

සඳ මඬලෙන් ඔබ පාද දිලේ
තරු කිරුළෙන් ඔබ හිස බැබලේ
හිරු රැස මෙන් ඔබ ගත දිලිසේ
ලොව සැම තැන ඔබ රුව පැසසේ

පව්වූ අපේ කුළුණැත් මවුනී
දුබල අපේ බලවත් රැජිණී
දුගිවූ අපේ නිති සරණයෙනී
සැම සිරිත් පිරි කන්තියනී